# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2096/77 - 2018 නොවැම්බර් මස 09 වැනි සිකුරාදා - 2018.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

*මගේ යොමු අංකය*: MLB/LND/LNDAQ/L1/50.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/6/2017/HW/220.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1994 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාලිම්බඩ ගමේ මු.පි. මාරා/2744 පිඹුරේ කැබලි අංක 1 සහ 2 වශයෙන් දැක්වෙන පහත සඳහන් ඉඩම දක්ෂිණ අධිවේගී (දකුණු කොටස දිගුව) ව්‍යාපෘතියේ ප්‍රතිස්ථාපන කටයුතු සඳහා ඉඩම් අත්කර ගෙන තිබේ:

**උපලේඛනය**

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: නුගදූගොඩවත්ත, නුගදූගොඩ හෙවත් නුගදූව; විස්තරය: ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත; ඉඩමේ මුල් හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය; හෙක්ටයාර් 0.6805.

02. **කැබලි අංක 2**

ඉඩමේ නම: නුගදූගොඩවත්ත, නුගදූගොඩ හෙවත් නුගදූව; විස්තරය: ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත; ඉඩමේ මුල් හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය; හෙක්ටයාර් 0.0062.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 දෙසැම්බර් මස 10 වැනි දින පෙ.ව. 10.30 ට මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2018 දෙසැම්බර් මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

දීපිකා කේ. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මාලිම්බඩ.

2018 නොවැම්බර් මස 05 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-1053


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.



1A - G 28918 – 17 (2018/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.